**උහන ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 03 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට උහන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**---------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) උහන නව පොළ භූමිය ඉදිකිරීම සඳහා දරන ලද රු.1,838,188 ක් ස්ථාවර වත්කම් යටතේ වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) රු.129,567 ක් වැය කර 2016 වර්ෂයේ දී සභාව විසින් ඉදිකර තිබුණු ගොනාගොල්ල සතිපොළ වැසිකිළි පද්ධතිය ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) කඩකුළී ලේඛනය අනුව සභාව සතු උහන හා වැරැන්කැටගොඩ කඩ කාමරවල වාර්ෂික තක්සේරු ආදායම රු.1,004,578 ක් වුව ද, මූල්‍ය ප්‍රකාශනවල රු.989,978 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.14,600 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) කඩකුළී ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට කඩකුළී හිඟය රු.313,381 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.298,781 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.14,600 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ස්ථාවර තැන්පතු සඳහා සමාලෝචිත වර්ෂයට අදාල පොළී ආදායම රු.168,735 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.124,776 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් රු.43,959 කින් පොළී ආදායම් අඩුවෙන් දැක්වුණි.

(ඊ) එකතුව රු.242,012 ක් වූ මුද්දර ගාස්තු ආදායම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආපසු ගෙවිය යුතු තැන්පත් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් වගකීම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වෙළෙඳ බලපත්‍ර ආදායම රු.33,750 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඌ) සභාවට අයත් වාහන 04 ක රු.1,055,000 ක් වූ තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ ඇතුළත් කර නොතිබුණු අතර, වාහන 08 ක 2017 තක්සේරු වාර්ථා අනුව වටිනාකම රු.23,450,000 ක් වුවත්, එය ස්ථාවර වත්කම්වල රු.33,277,143 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් රු.9,827,143 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**1.3.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

-----------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.7,654,088ක් වූ ගිණුම් විෂයන් 06 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.3 නීති,රීති,රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්**

-------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|---|
| | ---------------------------- | ----------- | ----------------- |
| | | (රු) | |
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 150(4) වගන්තිය | 33,750 | බලපත්‍ර ගාස්තු ගෙවීම පැහැර හැරි අවස්ථාවලදී එම පැහැර හැරීම සම්බන්ධයෙන් සභාවේ ලේකම්වරයා විසින් අධිකරණය වෙත වාර්තා කර එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | (i) ප්‍රාදේශීය සභා රීති 217 | 57,576,384 | සභාව සතු හා සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා සියළු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව පී.එස්.46 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | (ii) ප්‍රාදේශීය සභා රීති 180 | -- | සභාවේ ආදායම් එකතු කිරීම, ගබඩා පාලනය, චෙක්පත් නිකුත් කිරීම වැනි රාජකාරි වලට අදාල නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| | (iii) ප්‍රාදේශීය සභා රීති 59 - 66 | -- | සෑම වර්ෂයකම ආරම්භයේදී ප්‍රදේශය තුළ පරීක්ෂණ පවත්වා කර්මාන්ත බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 1647(ඉ) | -- | වාහන සම්බන්ධ තොරතුරු දැක්වෙන ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 | -- | සභාව භාවිතා කරනු ලබන වාහනවල ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 භාණ්ඩාගාර චක්‍රලේඛ -- | සභාව විසින් පරිගණක සහ පරිගණක උපාංග සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,024,652 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දී පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,045,620 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම, රැස්කල ආදායම් සහ හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| (i) වරිපනම් හා බදු | 1,069,876 | 1,044,785 | 1,043,573 | 3,414,214 | 1,069,876 | 1,044,785 | 1,058,929 | 3,375,198 |
| (ii) කඩකුළී | 1,057,748 | 989,978 | 936,441 | 298,781 | 1,048,148 | 1,029,058 | 929,390 | 245,244 |
| (iii) වෙළඳ බලපත්‍ර | 250,000 | 480,650 | 480,650 | - | 700,000 | 428,180 | 428,180 | - |
| (iv) වෙනත් ආදායම් | 3,975,000 | 2,683,967 | 3,690,216 | 2,674,037 | 3,975,000 | 2,112,542 | 2,495,809 | 1,968,799 |
| | 6,352,624 | 5,199,380 | 6,150,880 | 6,387,032 | 6,793,024 | 4,614,565 | 4,912,308 | 5,589,241 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාව විසින් 2017 දෙසැම්බර් 31 දිනට අයකළ යුතු මුළු ආදායම රු.10,788,621 ක් වූ අතර, වර්ෂය තුළ රු.6,150,880 ක් අයකර ගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාලව රු.4,637,741 හෙවත් සියයට 43 ක ආදායමක් අහිමි වී තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

**----------------**

2007 වර්ෂයේ වරිපනම් තක්සේරුව පදනම් කරගෙන වරිපනම් අයකිරීම සිදුකර තිබුණි. වරිපනම් බදු ලේඛනය අනුව 2017 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් රු.3,414,214 ක් වුවද, හිඟ ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

**2.2.4 කුළී**

**-------**

කඩකුළී ලේඛනය අනුව 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි කඩකුළී ආදායම රු.313,380 ක් වූ අතර, හිඟය අයකර ගැනීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

**2.2.5 බලපත්‍ර ගාස්තු**

**--------------**

සභා බල ප්‍රදේශයේ වෙළඳසැල් හිමියන් 35 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු වශයෙන් රු.33,750 ක් අයවිය යුතුව තිබුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**----------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ උසාවි දඩ රු.894,667 ක් හා මුද්දර ගාස්තු රු.1,779,370 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**------------------------------------------------------**

**3.1 කාර්යසාධනය**

**------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ) අත්හැර දැමූ කර්තව්‍යයන්**

**--------------------------**

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයන් තුළදී කර්තව්‍යයන් 02 ක් ආරම්භ කර ඒ සඳහා රු.3,152,188 ක් වැයකර තිබූ නමුත්, 2018 ජූලි 06 දින වනවිට එය අත්හැර දමා තිබුණි.

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

**---------------------------------**

කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම සඳහා 2015 ඔක්තෝබර් 19 දින මධ්‍යම පරිසර අධිකාරිය සහ උඩහ ප්‍රදේශය සභාව ගිවිසුමකට එළඹ තිබූ අතර, ඉදිකිරීම් සඳහා අනුමත කල මුදලින් සියයට 20 ක් හෙවත් රු.1,789,907 ක් 2015 ඔක්තෝබර් මාසයේදී සභාව වෙත ලබාදී තිබුණි. අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක් හෙවත් රු.1,314,000 ක් අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත්කරු වෙත 2016 පෙබරවාරි ලබා දී තිබුණි. ඉඩමේ අයිතිය නිරවුල් නොවීම නිසා ව්‍යාපෘතිය ආරම්භ කිරීම දිගින් දිගටම ප්‍රමාද වී තිබුණි. මේ හේතුවෙන් කසල එක්රැස් කරන ට්‍රැක්ටරය දිනකට කිලෝමීටර 20 කට වැඩියෙන් ධාවනය කිරීමට සිදුවී තිබූ අතර, 2016 වර්ෂයේ සිට 2018 මැයි දක්වා රු.284,000 ක් ඒ වෙනුවෙන් ගෙවීමට සිදුවී තිබුණි.

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

**------------------------**

තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව සභාව දැනුවත් වී නොමැති බව ප්‍රකාශ කර ඇති බැවින් සභාව ඒ සම්බන්ධව ඇති සූදානම සතුටුදායක නොවීය.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් 2009 ජනවාරි හා 2013 ජුනි බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණු කඩ කාමර 02 කට අදාලව රු.4,327 ක් පෙර බදුකරුවන්ගෙන් අයවිය යුතුව තිබූ අතර, එම කඩ කාමර නැවත පවරාගෙන තිබුණ ද අදාල හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු වරිපනම් දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කළ යුතු වුවත්, 2007 වර්ෂයේ දී අවසන් වරට වරිපනම් තක්සේරු කර තිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 06 ක් සඳහා නිලධාරීන් 10 දෙනෙකුගේ පුරප්පාඩු හා තනතුරු 02 ක් සඳහා නිලධාරීන් 02 දෙනෙකුගේ අතිරික්ත පැවතුණි.

(ආ) සභාවේ සේවය කර ස්ථාන මාරුවීම් ලැබූ සේවකයන් 10 දෙනෙකුගේ සහ විශ්‍රාම ගිය සේවකයකුගෙන් අයවිය යුතු රු.36,238 ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම**

ඉඩම් හා ගොඩනැගිලි විෂයයන් 07 ක් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් වශයෙන් ලේඛනගත කර නොතිබුණි.

**3.4.2 වත්කම් වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම**

2009 අප්‍රේල් 19 දිනැති අංක 1597/8 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව දුරකථන කුළුණු සඳහා අවම වශයෙන් එක් කුළුණකට රු.20,000 ක් බැගින් අයකළ යුතු වුවත්, සභා බල ප්‍රදේශය තුල දුරකථන කුළුණු 12 ක් පැවතිය ද ඒ සඳහා රු.240,000 ක මූලික ගාස්තුවක් අයකර නොතිබුණි.

**3.4.3 පවරා නොගත් වත්කම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ විවිධ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන ඉඩම් හා ගොඩනැගිලි විෂසයන් 08 කට අදාළ ඒකක 57 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාව වෙත පවරාගෙන නොතිබුණි.

(ආ) විවිධ ආයතන මඟින් සභාවට ලබාදුන් වාහන 09 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

සභාවට අයත් වාර්ෂික වටිනාකම රු.42,000 ක් වූ වැරැන්කැටගොඩ කඩකාමර සංකීර්ණය අංක 09 කාමරය ඉදි කළ දිනයේ සිට විගණන දින (2018 ජූලි 06) දක්වා නිෂ්ක්‍රීයව පැවතුණි.

**3.4.5 වාහන උපයෝජනය**

ධාවන තත්වයේ පවතින වාහන 25 න් වාහන 02 ක් සඳහා පමණක් වාර්ෂික ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ලබාගෙන තිබූ අතර, ඉතිරි වාහන 23 සඳහා එම වාහන සභාවට ලැබූ දින 2018 අගෝස්තු දක්වා එම සහතික ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව සභාව විසින් 2017 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර, රු.2,164,104 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු 05 ක් සිදුකර තිබුණි.

**4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 31 දිනට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2018 මැයි 03 වන දින, එනම් දින 33 ක් දක්වා කාල ප්‍රමාදයකින් පසුවය.

**4.2 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම සහ තථ්‍ය වියදම අතර සියයට 03 සිට සියයට 67 දක්වා පරාසයක විචලනයක් පැවැති බැවින්, අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලනය**

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ ලේකම්වරයාගේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | **පද්ධතිය** | **අඩුපාඩුව** |
|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | i. හිඟ ආදායම් අයකර නොගැනීම. |
| | | ii. අතුරු ව්‍යවස්ථා පනවා නොතිබීම. |
| | | iii. ආදායම් ප්‍රභව හඳුනා නොගැනීම. |

| | | |
|---|---|---|
| (ආ) | අයවැය පාලනය | අයවැය නිසි ලෙස පිළියෙල කර නොතිබීම. |
| (ඇ) | ගබඩා පරිපාලනය | භාණ්ඩ ගබඩා කිරීම නිසි පරිදි සිදු නොවීම. |
| (ඈ) | වත්කම් පාලනය | ස්ථාවර වත්කම්වල අයිතිය පවරා නොගැනීම. |
| (ඉ) | ගිණුම්කරණය | වත්කම් ගිණුම්ගත කර නොතිබීම. |
| (ඊ) | කොන්ත්‍රාත් පාලනය | i. ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැති වීම<br>ii. ඉදිකිරීම් සඳහා ලිපිගොණු පවත්වා නොගැනීම |